පොලිස් මාධ්‍ය කොට්ඨාසය,
14 වැනි මහල,
සුහුරුපාය,
බත්තරමුල්ල.
2025.12.22

**හිරු ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන් පොලිස් මාධ්‍ය කොට්ඨාසය නිකුත් කළ ලිපිය පක්ෂග්‍රාහී සහ පදනම් විරහිත බව දැන්වීම**

2025.12.21 දින සවස 6.55 හිරු ටී.වී. ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයේ පළවූ ඇඹිලිපිටියේ ගංජා පැළ වැටලූ පොලිස් නිලධාරියාට ප්‍රහාරයක් එල්ල වීම සම්බන්ධ ප්‍රවෘත්ති පිළිබඳ පොලිස් මාධ්‍ය කොට්ඨාසය එවන ලද ලිපියට ප්‍රතිචාර දැක්වීමට අපේක්ෂා කෙරේ.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය සඳහන් කරන ආකාරයට ගංජා වගා කළ ඉඩම ශාන්ත පද්මකුමාර මන්ත්‍රීවරයාට අයත් බව අප සඳහන් කර නොමැත. එම ඉඩම ඔහුගේ මාමණ්ඩියට අයත් එකක් බව අප වාර්තා කර තිබේ. නමුත් අදාළ ගංජා වගා කළ ඉඩම වැටලූ අවස්ථාවේ ඔබගේ පොලිස් නිලධාරියා විසින්ම එම වැටලීම වීඩියෝගත කර ඇත. එම අවස්ථාවේදී ඉඩමේ වැඩ කරමින් සිටි පුද්ගලයාගෙන් පොලිස් නිලධාරියා ප්‍රශ්න කරන අතර එහිදී ඉඩමේ අයිතිකරු පිළිබඳව විමසන ලදී. ඊට පිළිතුරු දෙන වැඩ කරමින් සිටි පුද්ගලයා පවසන්නේ "ඉඩම ශාන්ත මහත්තයාගේ, වගා කරන්නේ අපි" යනුවෙනි. අපරාධයක් සම්බන්ධයෙන් ඔබගේ පොලිසියම පටිගත කරන ලද එම සාක්ෂිය අප වාර්තා කරන තෙක් පොලිසිය රටට කිසිවක් අනාවරණය කළේ නැත. හිතාමතාම පොලිසිය එම ප්‍රබල සාක්ෂිය අධිකරණයට හෝ මාධ්‍යයට අනාවරණය නොකළේ ඇයි දැයි අපට තේරුම්ගත නොහැක. අපරාධයක් සම්බන්ධයෙන් පොලිසියම ලබාගත් එම ප්‍රබල සාක්ෂිය අප රටට වාර්තා කළේ ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතියට ගරු කරමිනි. ජනමාධ්‍ය නිදහස මත පදනම්ව ජනතාවට එම වීඩියෝව නැරඹීමට ඇති අයිතිය සඳහා පොලිස් මාධ්‍ය කොට්ඨාසය ද ගරු කළ යුතුය. මහජන බදු මුදලින් යැපෙන පොලිස් මාධ්‍ය කොට්ඨාසය හිරු ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන් මෙවැනි ලිපි යැවීම හරහා ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය සහ ප්‍රජාතන්ත්‍රවාදයට බලපෑම් කරන බව අපගේ විශ්වාසයයි. එසේම සූරියකන්ද පොලිසියේ කොස්තාපල් සුසන්ත හෙට්ටිආරච්චි මහතා කරන ලද පැමිණිලි සහ ප්‍රකාශ අනුව ඔහුට සිදුවූ පහරදීම සහ ගංජා පැළ වැටලීම අතර සම්බන්ධයක් ඇත. පොලිස් විමර්ශනවලදී එවැනි සම්බන්ධයක් අනාවරණ වී නොමැති බව පොලිස් මාධ්‍ය කොට්ඨාසය එවන ලද ලිපියේ සඳහන් වුවද එවැනි සම්බන්ධතාවයක් ඇති බව තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි හා මූලාශ්‍ර ඕනෑවටත් වඩා අප සතුව ඇත. එබැවින් පොලිස් මාධ්‍ය ප්‍රකාශක කොට්ඨාසය හිරු ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් දරන ස්ථාවරය අපි තරයේ ප්‍රතික්ෂේප කරමු. පොලිස් මාධ්‍ය කොට්ඨාසයේ ක්‍රියාකලාපය නිදහස් මාධ්‍යයේ පැවැත්මට සහ පොලිසියේ ස්වාධීනත්වයට ද ප්‍රශ්නාර්ථයක් බව වැඩිදුරටත් සඳහන් කරන්නෙමු.

ස්තුතියි.

------------------------------
තරංග ජයකොඩි
නියෝජ්‍ය ප්‍රවෘත්ති අධ්‍යක්ෂ - හිරු ටී වී


ABC
Asia Broadcasting Corporation Private Limited
*A Rayynor Silva Holdings Company*

Level 35 & 37, East Tower,
World Trade Centre,
Echelon Square,
Colombo 01, Sri Lanka.

Tel : +94 112 337 555 (Hunting)
+94 115 360 360 (Hunting)
Fax : +94 114 799 793 (General)
+94 112 346 875 (News)

website: www.asiabroadcasting.lk



HIRU TV
HIRU FM
SUN FM
GOLD FM
SHAA FM
SOORIYAN FM

*Music*
*News & Views*
*Entertainment*
*Topical Debates*
*Features*
*Sports*
*Competitions*
*Interactive Dialogues*
*Live Broadcasting*